ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ : මූල්‍ය බුද්ධි ඒකකය**

**දිනය : 2017 අගෝස්තු 04**

## ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, භූතාන සහ චීන මූල්‍ය බුද්ධි ඒකක සමඟ අන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුම්වලට එළැඹෙයි





2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය භූතාන සහ චීන මූල්‍ය බුද්ධි ඒකකයන් සමඟ 2017 ජූලි 17-21 දිනයන්හිදී කොළඹදී පැවැති මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ 20වන වාර්ෂික සමුළුවේදී අවබෝධතා ගිවිසුම්වලට එළැඹිණි. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමට අදාලව පරීක්ෂණ සහ නඩු පැවරීම්වලට අදාළ මූල්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම මෙම අවබෝධතා ගිවිසුම්වලට එළඹීමේ මූලික පරමාර්ථය වේ. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ආචාර්ය එච්. අමරතුංග මහතා, චීන මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ජෙනරාල් ලුවෝ යුබිං මහත්මිය සහ භූතාන මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති, මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානි නාජෝ ඩෝජි මහතා සමඟ මෙම අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තබන ලදී.

චීනය 2001 වසරේදී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සාමාජිකත්වය ලබා ගන්නා ලද අතර 2007 වසරේදී මූල්‍ය කාර්ය සාධක බලකායේ පූර්ණ සාමාජිකයෙකු ලෙස පත්විය. 2010 ඔක්තෝම්බර් මාසයේදී භූතාන මහ බැංකුව යටතේ ආරම්භ කරන ලද භූතාන මූල්‍ය බුද්ධි ඒකකය 2011 වසරේදී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.

ජාත්‍යන්තර වශයෙන් එකිනෙකට සම්බන්ධතාවයන් පවතින සහ ගෝලීය වශයෙන් සිදුවන අපරාධයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා එක් එක් රටවල් අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ලොව පුරා ඇති මූල්‍ය බුද්ධි ඒකකයන් මෙවැනි අවබෝධතා ගිවිසුම්වලට එළැඹෙයි. මේ අනුව, මෙම අවබෝධතා ගිවිසුම් හරහා මූල්‍ය බුද්ධි ඒකකයන් අතර මනා සහයෝගීතාවයක් ඇති කරගනු ලබන අතර රටවල් අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සකසා දීම සිදුවේ. අවබෝධතා ගිවිසුම්වලට ඒවා ලොව පුරා පැතිර ඇති මූල්‍ය බුද්ධි ඒකකයන්ගේ එකමුතුවෙන් සැදුම්ලත් එග්මොන්ට් කණ්ඩායම විසින් හඳුන්වා දී ඇත.

මෙම අවබෝධතා ගිවිසුම් දෙක අත්සන් කිරීමත් සමඟ මේ වන විට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අත්සන් තබා ඇති අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 35ක් දක්වා වැඩි වී ඇත.